## 221 සිතුවිල්ලක් විලසින් මා

සිතුවිල්ලක් විලසින් මා හද තෙරපනවා
සතුටු සිනා ලෙස මා මුව සිනා නගනවා
කඳුලැල්නක් විලසින් මා නෙත සෝදනවා
කෙලෙසක හෝ මා හදටම ඔබ ළං වෙනවා

ජේසුනී මගේ හදටම ඔබ ළංවෙනවා
සිනාවෙයි කඳුළු බිඳුවෙයි සැඟවී එනවා//

ගීතිකා ලෙසින් මා හද තුළ ගොඳුරනවා
වේදනා තුළින් මා වෙත මතක මවනවා
පාළුවේ නිසංසල බව ඔබ කැඳවනවා
කෙලෙසක හෝ මා හදටම ඔබ ළංවෙනවා

පහනක් ලෙස මා හා අඳුරේ ඇවිදිනවා
තන්හා උණුසුම සිත්තුළ නිවලා යනවා
සයුරේ අඹරේ හැංගී ඉන්න හිතෙනවා
කෙලෙසක හෝ මා හදටම ඔබ ළංවෙනවා